# IV කාර්ය මණ්ඩල පුවත්

අධිපති, එච්. ඊ. තෙන්නකෝන් මහතා අධිපති වරුන්ගේ දසවැනි සියැන්සා සමුළුවට සහභාගිවීම සඳහා 1973 ජනවාරි 15 වැනි දින බැංකොක් නුවරට පිටත්ව ගොස් 1973 ජනවාරි 25 වැනි දින ආපසු පැමිණියේය.

ආසියානු නිෂ්කාශන සංගමය පිහිටුවීමේ ගිවිසුමට අත්සන් තැබීම සඳහා අධිපතිවරයා 1973 අප්‍රේල් 15 වැනි දින ටෝකියෝවට පිටත්ව ගොස් 1973 අප්‍රේල් 26 වැනි දින ආපසු පැමිණියේය.

රන්පවුම් කලාපයේ මහ බැංකු අධිපති වරුන්ගේ සමුළුවට සහභාගිවීම සඳහා අධිපති වරයා 1973 ජූනි 12 වැනි දින ලන්ඩනයට පිටත්ව ගියේය. ඔහු ලන්ඩනයේ සිටි කාලය තුළ ලන්ඩනයේ බැංකු සමග සාකච්ඡා පවත්වන ලදී. අනතුරුව ඔහු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා පැවැත්වීම සඳහා වොෂින්ටනයට ගොස් 1973 ජූලි 6 වැනි දින ආපසු පැමිණියේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව වෙනුවෙන් විකල්ප අධිපතිවන අධිපතිවරයා, කෙන්යාවේ නායිරෝබිහි පැවැත්වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි හා ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ වාර්ෂික සභා රැස්වීම් වලට සහභාගි විය. 1973 සැප්තැම්බර් 20 වැනි දින ශ්‍රී ලංකාවෙන් පිටත් වූ අධිපතිවරයා 1973 ඔක්තෝබර් 4 වැනි දින ආපසු පැමිණියේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ජාත්‍යන්තර සංවර්ධන හා ප්‍රතිසංස්කරණ බැංකුවේ සභා වාරයන්ට සහභාගිවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් සී. ඒ. කුරේ මහතා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි කාලය තුළදී, මුදල් අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් එල්. බී. අබේරත්න මහතා, මුදල් මණ්ඩලයේ නිල සාමාජිකයා වශයෙන් කටයුතු කළේය.

1973 ජනවාරි 15 වැනි දින සිට 1973 ජනවාරි 25 වැනි දින දක්වා අධිපතිවරයා කාර්යාල යෙන් බැහැරව සිටි කාලච්ඡේදය තුළ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති පදවියට පත් කරනු ලැබූ නියෝජ්‍ය අධිපති ආචාර්ය ගාමණී කොරයා මහතා මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය. 1973 ජූනි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු යුරෝපා ආර්ථික සමුළුවේ ශ්‍රී ලංකාවේ තානාපති වශයෙන් වැඩ භාර ගන්නා ලදී.

නියෝජ්‍ය අධිපති, ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතා, විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දිගටම සේවාව කරන ලදී.

අධිපතිවරයා එතෙර සිටි, කාලච්ඡේදයන් වන 1973 අප්‍රේල් 16 සිට 1973 අප්‍රේල් 26 දක්වාත්, 1973 ජූනි 13 සිට 1973 ජූලි 6 දක්වාත්, 1973 සැප්තැම්බර් 20 සිට 1973 ඔක්තෝබර් 4 දක්වාත්, සහ අධිපතිවරයා කාර්යාලයෙන් බැහැරව සිටි කාලච්ඡේදයන් වන 1973 මැයි 21 සිට 1973 මැයි 25 දක්වාත්, 1973 ඔක්තෝබර් 17 සිට 1973 ඔක්තෝබර් 23 දක්වාත්, 1973 නොවැම්බර් 15 සිට 1973 නොවැම්බර් 23 දක්වාත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති පදවියට පත් කරනු ලැබූ නියෝජ්‍ය අධිපති පී. වී. එම්. ප්‍රනාන්දු මහතා මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය.

අධිපතිගේ සහකාර, කේ. ගුණරත්නම් මහතා, 1973 අප්‍රේල් 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුවෙන් ඉල්ලා අස්වන ලදී.

එස්. තයනිති මහතාත්, ඒ. එච්. ද සිල්වා මහත්මියත් දිගටම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සේවාව කරන ලදී.

සවුදි අරාබියාවෙහි එක්සත් ජාතීන්ගේ සේවාවෙහි සිටි බී. බී. ඩී. එම්. පෙරේරා මහතා 1973 ජූලි 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් ඉල්ලා අස්වන ලදී.

ඒ. එස්. ජයර්වධන මහතා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ සාමාජිකයෙකු වශයෙන් දිගටම සිටින ලදී.

ආචාර්ය, එස්. ටී. ජී. ප්‍රනාන්දු මහතා නියෝජිත සමාගම් සහ තැරැව්කරුවන්ගේ සමාගම් කටයුතු පරීක්ෂා කර බැලීමේ කොමිසමේ සාමාජිකයෙකු වශයෙන් දිගටම සිටින ලදී.

ආචාර්ය ජී. උස්වත්ත ආරච්චි මහතා එක්සත් ජාතීන්ගේ සේවාවෙහි දිගටම සිටින ලදී.

ක්‍රම සම්පාදක සහ රැකී රක්ෂා අමාත්‍යාංශයට මුදා හරින ලද එන්. එම්. කප්පාගොඩ මහතා 1973 ජූලි 31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන්ඉල්ලා අස්වන ලදී.

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයට මුදාහරින ලද වී. එන්. ඩී. නානායක්කාර මහතා 1973 අප්‍රේල් 1 වැනි දින සිට නැවතත් මහ බැංකු සේවාවට පැමිණෙන ලදී.

මුදල් අමාත්‍යාංශයට මුදාහරින ලද පී. එම්. නාගහවත්ත මහතා 1973 අප්‍රේල් 1 වැනි දින සිට නැවතත් මහ බැංකු සේවාවට පැමිණෙන ලදී.

විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ මහ බැංකුවේ පහත දැක්වෙන නිලධාරීන් රජයට සහ රජයේ සංස්ථාවනට පූර්ණකාලීන වශයෙන් මුදාහරිනු ලැබිණි.

එච්. ආර්. ද සොයිසා සහ එච්. එම්. ආර්. ඇල්ලෙපොල මහතුන් මුදල් අමාත්‍යාංශයට.

ආචාර්ය එස්. එම්. පී. සූරියආරච්චි, පී. එම්. හසන් සහ ආචාර්ය එම්. ඒ. ප්‍රනාන්දු (1973 අගෝස්තු 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි) යන මහතුන් ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට.

පී. එච්. සිරිසේන මහතා රාජ්‍ය පරිපාලන පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට.

පී. බී. කරදවල මහතා නාවික හා සංචාරක අමාත්‍යාංශයට.

වී. ජී. පුංචි අප්පුහාමි මහතා රාජ්‍ය මැණික් සංස්ථාවට.

ආචාර්ය ආර්. සී. වනිගතුංග මහතා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට.